**ඉමදූව ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඉමදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2016 වර්ෂය තුළ නිමකල කෝඹල හොරමඩුල්ල ප්‍රජා ජල ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා ඉකුත් වර්ෂයේ ලැබී තිබූ රු.267,583 ක මුදල ප්‍රාග්ධන ආධාර යටතේ ගිණුම්ගත කර නොතිබීම සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | වීථි පහන් නඩත්තු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ පෞද්ගලික ආයතනයකට ගෙවන ලද රු.50,000 ක මුදල ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් තැබීම නිවැරදි කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ එම මුදල් ගෙවා නොමැති නිසා ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කර ඇත. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් රු.119,558 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාග්ධන වැය යටතේ රු.1,275,252 ක් වියදම් කර සිදු කරන | ස්ථාවර වත්කම් නිවැරදිව | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට |

| | | |
|---|---|---|
| ලද ඉදිකිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ප්‍රාග්ධනිත කළ යුතු වේ. | කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.1,953,456 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂ සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන අනුව දැක්වෙන ශේෂයන් අතර රු.202,980 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 වර්ෂයේ සිට පැවත එන එකතුව රු.201,325 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක් සමාලෝචිත වර්ෂයේදීත් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගතයුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |

**(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.69,845,259 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | 31,131 | සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලැබූ ආපනශාලාවකින් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයකළ යුතු බදු ආදායම් අය කර නොතිබුණි. | පනත ප්‍රකාරව නිශ්චිත බදු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 103 හා 104 | 15,000 | 2018 වර්ෂය තුළ අස්ථානගත වූ මුදල් පිළිබඳව කටයුතු කර නොතිබුණි. | අස්ථානගත වූ මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | - | සභාව සතු වාහන 04 ක් වසර ගණනාවක සිට ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව සභාවට අයත් භූමියක නවතා තිබුණු අතර අපහරණය සඳහා කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | සභාවේ අනුමැතියට යටත්ව ජූනි 30 ට පෙර යකඩ සඳහා විකිණීමට කටයුතු කරමි. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,642,431 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,843,369 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

## 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම,රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 518,900 | 610,325 | 255,422 | 594,425 | 151,200 | 123,209 | 300,260 | 248,391 |
| කුලී | 4,771,000 | 888,150 | 989,950 | - | 3,100,000 | 3,139,202 | 3,154,202 | - |
| බලපත්‍ර ගාස්තු | 150,000 | 212,000 | 260,700 | 177,366 | 200,000 | 153,700 | 170,900 | 152,466 |
| වෙනත් ආදායම් (කුරුළු වගාව) | 450,000 | - | - | - | 2,900 | - | 21,106 | - |
| | 5,889,900 | 1,710,475 | 1,506,072 | 771,791 | 3,454,100 | 3,416,111 | 3,646,468 | 400,857 |

## 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත කළ මුළු ආදායම රු.5,889,900 ක් වූ අතර බිල් කල ආදායම රු.1,710,475 ක් විය. රු.400,857 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.2,111,332 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.1,506,072 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 71 ක් විය. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2.2.3 වරිපනම් හා බදු**

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.248,391 ක් වූ අතර, රු.610,325 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.858,716 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.255,422 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.594,425 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ වරිපනම් අයකර ගතයුතු වේ. | ඉදිරියේදී වරිපනම් හිඟය අඩු කර ගැනීමට පියවර ගනිමි. |

**2.2.4 කුලී ආදායම**

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත කුලී ආදායම රු.4,771,000 ක් වුවද, වර්ෂයේ බිල්කිරීම් රු.888,150 ක් වූ අතර, මුළු අයවීම් රු.989,959 ක් වී තිබුණි. වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 81 ක් අඩුවෙන් බිල් කිරීම් කර තිබුණි. | ඇස්තමේන්තුගත ආදායම් බිල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2.2.5 වෙනත් ආදායම්**

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු කුරුඳු වගා ව්‍යාපෘතියෙන් සමාලෝචිත වර්ෂයේදී රු.450,000 ක ආදායමක් ඇස්තමේන්තුගත කර තිබුණ ද, කිසිදු ආදායමක් අයකර ගෙන නොතිබුණි. | ඇස්තමේන්තුගත ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.17,982,810 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.3,281,971 ක් ලැබිය යුතුව තිබුණි. | ලැබිය යුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### (අ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් බෝගහගොඩ සතිපොල සංවර්ධනය සහ නගර සංවර්ධනය සඳහා ඉඩමක් මිලදී ගැනීම වෙනුවෙන් රු.2,280,000 ක ණය මුදලක් 2014 වර්ෂයේ ලබා ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,111,783 ක ණය වාරික හා පොලී මුදල් ගෙවා තිබුණි. මෙම ණය මුදල සති පොල ඉදිකිරීම වෙනුවෙන් ඉඩමක් මිලදී ගැනීමේදී වන්දි ගෙවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබූ නමුත්, මේ වන විටත් ඉඩමක් මිලදී ගෙන නොතිබුණි. | ඉඩම මිලදීගෙන අදාළ කාර්යයේ යෙදවීම කළ යුතු වේ. | පොල භූමියේ භුක්තිය ප්‍රාදේශිය සභාව භාර ගෙන ඇති අතර, පොල සංවර්ධනය සඳහා භූමිය සකස් කිරීමට අදාළ මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. |

**(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

**---------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------ | ------------------- |
| 2017 අප්‍රේල් 20 දිනැති අංක 2015/53 දරන ගැසට් නිවේදනය අනුව සභාව විසින් කසළ කළමනාකරණය සම්බන්ධයෙන් දිගු කාලීන සැලැස්මක් සකස් කර නොතිබුණි. | කසල කළමනාකරණය සඳහා විධිමත් සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

**----------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------ | ------------------- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කළ යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------ | ------------------- |
| (අ) | සභාවේ සේවය කරන විවිධ තනතුරු වලට අයත් සේවකයින් 08 දෙනෙකු නිත්‍ය තනතුරට අදාළ නොවන රාජකාරීවල නිරත වීම නිසා සභාවේ කාර්යාල කාර්ය සහායක තනතුර පුරප්පාඩුව පැවතුණි. | නිත්‍ය රාජකාරී පැවරීමට හා රාජකාරී කටයුතු විධිමත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල ඇති පුරප්පාඩු 04 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 01 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | සේවක සැලැස්මට අනුව සේවක සංඛ්‍යාව විධිමත් කර ගත යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයන් 05 ක එකතුව රු.25,196,002 ක් වූ ඉතිරිවීම් තිබූ අතර, එය සියයට 37 සිට සියයට 80 අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |
| (ආ) | ආදායම් විෂයයන් 04 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම්වල එකතුව රු.13,827,748 ක් වූ අතර, එම අගයන් සියයට 21 සිට සියයට 78 දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |
| (ඇ) | විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික වැය විෂයෙහි අහිතකර විචලනය සියයට 67 ක්ව පැවතුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |